(1)

## 1 පරිච්ඡේදය

ලූක් කතුවරයා, ඔහු ලියූ ශුභාරංචිය මෙන්ම "ක්‍රියා පොතද" ***තියෝපිලස්*** නැමැති කෙනෙකු වෙත ලියා ඇති බව, පොත් දෙකේම ආරම්භයේදීම දැකගත හැකි කරුණකි. ඒ තැනැත්තා කවුරුන් විය හැකිදැයි අපි ක්‍රියා පොතේ 4 වැනි පරිච්ඡේදයට පැමිණි කල දැකගන්නට යන්නෙමුව.

යාෂුවා වහන්සේ මළවුන්ගෙන් උත්ථානව, දවස් 40ක් තුල, කළ කී දේ 'ක්‍රියා' 1:3 නේ සඳහන්වේ. එලෙසම ලූක් ශුභාරංචියේ 24:41 - 43 සහ යොහාන් 21:9 සහ 13 වෙනි පදද, එලෙසම එතුමන් කළ කී දේ සඳහන් කරමින්, ආහාර පවා අනුභව කල බවද පෙන්නුම් කරයි. **එලෙසම *අපද* මරණින් නැගිටුනු පසු, *''ජීවන වෘක්ෂයෙන්ම''* අනුභව කරන බව, එළිදරව් 2:7තේ යාෂුවා වහන්සේම පවසනසේක.** එම පොතේම 19 වැනි පරිච්ඡේදයේ **බැටළු පැටවාණන්ගේ සරණ මංගල්‍යයේ *'භෝජන සංග්‍රහය'*** [9] ගැන පවසයි. වැඩිපුරම උපුටා දක්වන බයිබල් පදය එළිදරව් 3:20 වේ. එහිදීද 'ආහාර අනුභවය' සඳහන් වේ. එය මුලික වශයෙන් **ඊශ්‍රායෙල් ඇතුළු** මුළු මැද පෙරදිගටම අදාල වන්නේ, **''සහභාගිකම්'' සම්බන්ධවවේ.** ලංකාවේ අපි ***"එන්න තේ එකක් බොමු"*** යයි පවසනවා සේ, අදටත් යුදෙව් මිනිසුන් තම මිතුරන්ට ආරාධනා කරන්නේ ***"එන්න රොටි කඩමු"*** කියායි.

ක්‍රියා 1 : 4 සහ 5 වැනි පදවල ස්වාමීන් වහන්සේ ***ආඥාවක්*** දෙමින්, තම ගෝලයන්ට පැවරෙන **'සේවාවට' *සන්නද්ධ වනතුරු*** 'යෙරුසලමින් ඉවත්ව ***<u>නොයන</u>*** ලෙස' පැවසුසේක. අප සෑම කෙනෙක්ම දෙවියන් වහන්සේව අත්දුටු මුල් දිනවල ඉතා උද්යෝගිමත්ව මුණගැසෙන සෑම කෙනෙක් සමගම අත්දුටුදේ බෙදාගත් සැටි, තවමත් මතක තිබෙනවාට සැකයක් නැත. එකල අපි දෙවිඳුන්වත් 'පසුකර දිවීමට මෙන්' කටයුතු කළෙමු. **<u>යාෂුවා වහන්සේ සෑමදෙයක්ම නිසියාකාරව කරන හෙයින්,</u>** එකල ගෝලයන් පමණක් නොව, <u>අදටත් එතුමන්ව අනුගමනය කරන අය</u>, **"*ප්‍රථමයෙන්* ශුද්ධාත්මයාණන්ගෙන් සන්නද්ධ විය යුතු බව" *පෙන්නුම් කරදුන් සැටි,* ලූක් ශුභාරංචියේ 24:49 යේද සඳහන්වේ.**

එය **'පියාණන් වහන්සේගේ පොරොන්දුව'** සම්පූර්ණ වනතෙක් ලෙස ලියැවී තිබේ. මතෙව් 11:12 සමහර අයට ප්‍රහේලිකාවක් විය හැකියි. එය නම්, ''යොහාන් බව්තිස්මගේ දින පටන් දේව රාජ්‍යය බලගතු ලෙස ඉදිරියට පැමිණි බවත්, බලසම්පන්න අය එය බලහත්කාරයෙන් ඉදිරියට ගෙනයන බවත්ය''. යොහාන් බව්තිස්ම සහ යෘෂුවා වහන්සේ, තමන්ගේ සේවාවන් ආරම්භ කළේද, එක හා සමාන කියමනකින් බව, මතෙව් 3:1 සහ 4:17 පෙන්නුම් කරදෙති. එම කියමන නම් **"පසුතැවෙන්න ස්වර්ග රාජ්‍යය ලංවී තිබේ"** යන්නවේ.

***'සටන'*** පවතින්නේ **"ආලෝකයේ රාජ්‍යය" සහ** ***'අන්ධකාරයේ රාජ්‍යය'*** අතර බව දේව වචනය පැහැදිලිව පෙන්නුම් කරදෙයි. ''දෙවිපියාණන් වහන්සේ, අපව අන්ධකාර රාජ්‍යයේ ග්‍රහණයෙන් ***මුදාගෙන,*** **තම පුත්‍රයාණන්ගේ** ***'ආලෝකයේ රාජ්‍යයට'*** ඇතුල්කල බව'' කොලොස්සි 1:13 සඳහන් කරයි. යෘෂුවා වහන්සේ පිළිගැනීමෙන් පසු, අපගේ ජීවිත පාපිෂ්ඨ පුරුදු වලින් ***මිදී,*** වැඩිපුර යහපත කිරීමට පෙළඹෙන අයුරු අපිම **අත්දැක** ඇත්තෙමු.

ඕනෑම කෙනෙකුට සටනක ජයග්‍රහනය අත්දැකීමට ***''බලය''*** **අවශ්‍ය වේ.** ක්‍රියා 1:5 සහ 1:8 වැනි පදවල යෘෂුවා වහන්සේ පැවසු වදන් වලින්, අප **'එම බලය'** ලබන සැටි පෙන්නුම් කළසේක. එමෙන්ම 'මුද්‍රික පානයෙන් නොව ශුද්ධාත්මයාණන්ගෙන් පිරෙන්නැයි' පාවුළුතුමාද ලිවූ බව එපීස 5:18 සඳහන් කරයි. එහි නිසි අර්ථය, **'එකවරක් නොව නිතරම** ***පිරෙමින් සිටීම'*** බව, ග්‍රීක් භාෂාවේ පැහැදිලිව පෙන්නුම් කෙරේ. එම නිසා ***අපද දිනපතාම ශුද්ධාත්මයාණන්ගෙන් පිරිය යුතුබව,*** ඉතා පැහැදිලිය. තමන්ට ''ස්වාමිනි ස්වාමිනි කියන හැමදෙනාම ***නොව,*** **ස්වර්ගයේ සිටින තම පියාණන් වහන්සේගේ කැමැත්ත කරන්නන්** ***පමණක් ස්වර්ග රාජ්‍යයට ඇතුල්වන*** බව'' යෘෂුවා වහන්සේ පැවසුසේකැයි මතෙව් 7:21කේ සඳහන් වේ. එහෙයින් **"දෙවි පියාණන්ගේ කැමැත්ත කුමක්දැයි?"** ***දේව වචනය නිසියාකාරව හැදෑරීමෙන්,*** **ශුද්ධාත්මයාණන්ගෙන් ඉගෙන ගැනිම,** අප සැමගේම ***යුතුකමවේ***. ඉන්පසු අප එය ක්‍රියාවට නගනකල, ***එතුමන්ගේ කැමැත්ත*** **ස්වර්ගයේ මෙන් පොළවෙහිද ඉෂ්ටවනු ඇත.**

**දෙවිඳුන්ව මහිමයට පත්කිරීම** සෑම ඇදහිලිවන්තයෙකුගේම **ආශාව වේ.** ඒ පිළිබඳව අපට තිබෙන ***අනර්ඝතම ආදර්ශය*** **යෘෂුවා වහන්සේමයි.** එතුමන් අන්තිම රාත්‍රියේ, 'යෙත්සමනි උද්‍යානයට' යෑමට පෙර තම ගෝලයන් සමග කළ යාච්ඤාවේ, එය සඳහන්වේ.

එහි ආරම්භයේදිම, **"පියාණෙනි, *ඔබතුමන්* මට පැවරූ කාර්ය භාරය *හමාර* කිරීමෙන්, පොළවේ මම ඔබවහන්සේව *මහිමයට* පත්කළෙමියි"** පැවසු බව යොහාන් 17 : 4 ලියැවී ඇත. ගෝලයන් එතුමන්ව බොහෝ අවස්ථාවල හමුවු බව ක්‍රියා 1:3 සඳහන් වේ. ඒ එක් අවස්ථාවක, ***යුදෙව්වන් ලෙස*** ඔවුනට වැදගත් වූ ප්‍රශ්නයක් ඇසු බව ක්‍රියා 1:6 සඳහන් කරයි. එය නම්, ඔබතුමන් **"රාජ්‍යය** *නැවත වරක්* 'ඊශ්‍රායල්' හට ***දැන්*** **පවරනවාද?"** යන්නැයි.

යෑෂුවා වහන්සේ මරණින් නැගිට්ට පසු, **'දේව රාජ්‍යය පිළිබඳව' කථා කල බව** ක්‍රියා 1:3 සඳහන් කරයි. එතුමන් දේශනා කලේ **'රාජ්‍යයක් පිලිබඳව *පමණක්ම'*** බව, බොහෝ කිතුණුවන්ට වැටහි ***නොමැතිකම*** ඉමහත් කණගාටුවට කරුණකි. මාර්ක්, ලූක් සහ යොහාන් ඔවුන්ගේ ශුභාරංචිවල **'දේව රාජ්‍යය'** යන කියමන භාවිතා කරන අතර, මතෙව් **'ස්වර්ග රාජ්‍යය'** යැයි, සඳහන් කරයි. යොහාන් බව්තිස්ම සහ යෑෂුවා වහන්සේ, තම සේවාවන් ආරම්භයේම පැවසු කියමන **'ස්වර්ග රාජ්‍යය පිළිබඳව'** බව ඉහත පෙන්නුම් කලෙමි. මතෙව් 6:33නේ "***ප්‍රථමයෙන්*** රාජ්‍යය සහ එහි ධර්මිෂ්ඨකම සොයන්න, එවිට අනික් සියල්ල ලැබෙන්නේ යැයි" සඳහන්වේ. එමෙන්ම යාඥා කිරීමට අපට උගන්වන්නැයි ගෝලයන් පැවසුකළ, යෑෂුවා වහන්සේ, **'ඔබගේ රාජ්‍යය පැමිණේවා'** යැයි ස්වර්ගයේ සිටින පියාණන්ට යාඥා කරන ලෙස පැවසු බව, අපි දනිමු. මේ වදන් වලින් පැහැදිලි වන්නේ, යොහාන් බව්තිස්මගේ දිනවල ආරම්භ වී යෑෂුවා වහන්සේ විසින් ඉදිරියට ගෙනාවාවු එම රාජ්‍යය, **ශුද්ධාත්මයාණන්ගේ බලයෙන්** ***පිරුණු අය,*** ශක්තිමත්ව ඉදිරියට ගෙන යා යුතුබවයි. **'රාජ්‍යය'** යන වචනය, ග්‍රීක් බසින් **"*ටේස් බැසිලෙයිආස්*"** වේ. එයින් අර්ථවත් වන්නේ, භූගෝලීය රාජ්‍යයක් මෙන්ම, ***පුද්ගලයෙකුගේ ජීවිතය තුල,*** **තව කෙනෙකු වැජඹීමද වේ .**

**"දේව රාජ්‍යය ඔබ තුල"** යැයි අප සමිඳුන් පැවසුවේ එම නිසයි. එයින් අර්ථවත් වන්නේ, ***ක්‍රිස්තුස් වහන්සේ,*** එතුමන්ගේ ***අනුගාමිකයන්ගේ ජීවිතවල*** **"රජ කිරීමයි".** ***'ක්‍රිස්තුස්'*** යන වචනයේ අරුත, ***'ආලේපලත්'*** බව බොහෝ දෙනෙක් දන්නා කරුණකි. බයිබලයේ **'ආලේප' කෙරුණේ** රජවරුන් බව පැහැදිලිව සඳහන් වේ. ***අපගේ 'තම කැමැත්ත' නැසෙන තරමට,*** අපගේ ජීවිතවලද, **එතුමන්හට රජ කිරීමට අවස්ථාව උදාවනු ඇත.**

"මා පසුපස ***එන්න,*** දිනපතා 'තම කැමැත්ත' ***පසෙකලා,*** කුරුසිය කරටගත යුතුබව" එතුමන් පැවසුවේ එහෙයිනි. ගෝලයන් බලාපොරොත්තුව සිටියේ, ***ඔවුන්ගේම ශුද්ධ*** **ලියවිලි වන බයිබලයේ සඳහන් වන,** ***යුදෙව් මෙසියස් වහන්සේ පැමිණ,*** **"ඊශ්‍රායල් රාජ්‍යය" ස්ථාපිතකොට 'එහි රජ කරනවා' දැකීමටය. වර්තමානයේද** ***යුදෙව්*** **මිනිසුන්ගේ බලාපොරොත්තුව එයම වේ.** ක්‍රියා 1:6 සඳහන් ප්‍රශ්නය ගෝලයන් ඇසුවේ එම නිසාය. ඔවුන් එකල නොදැන සිටිය දේ නම්, **මෙසියස් වහන්සේ ඊශ්‍රායලයේ රජ කරන්නේ,** ***එතුමන්ගේ දෙවෙනි පැමිණීමෙන් පසුව බවයි.***

ඊළඟට මෙම පොතෙහි සඳහන් වන ***දේ*** ලූක් 1:32 සහ 33නේ පැහැදිලිව සඳහන් වුවත්, එය බොහෝ දෙනෙක් මවිතයට පත්කරන්නාවු කරුණක් වන බව නොඅනුමානයි. එය නම් **යාෂුවා වහන්සේ නැවත පැමිණෙන්නේ** ***දාවිත් රජුගේ සිංහාසනය මත හිඳ,*** **'යාකොබ්ගේ වංශය' කෙරෙහි රජ කිරීමට බවයි.** ***යාෂුවා වහන්සේ*** දැන් අසුන් ගෙන සිටින්නේ, ස්වර්ගයේ පිහිටි **පියාණන් වහන්සේගේ සිංහාසනය මත,** එතුමන්ගේ දකුණු පස බව, මාර්ක් 16:19 සහ එළිදරව් 3:21 හි සඳහන් වේ. **යාෂුවා වහන්සේ** ***'රජවරුන්ගේ රජ'*** බව එළිදරව් 19:16 සඳහන් කරයි. එලෙසම, කුරුසියෙහි එතුමන්ගේ හිසට උඩින් තිබුණාවු දැන්වීම් පුවරුවේ සඳහන්වූ ප්‍රකාර, ***යාෂුවා වහන්සේ යුදෙව්වන්ගේ රජද වේ.***

**බයිබලය** ***යුදෙව්*** **ග්‍රන්ථයකි.** ***එහි සඳහන් "මෙසියස් වහන්සේ"*** **යුදෙව් රජෙකි.** එය ලිවීමට දෙවියන් වහන්සේ පාවිච්චි කල මිනිසුන් 40ක් පමණ වේ. දෙදෙනෙකු හැරෙන්නට (යෝබ් සහ ලූක්), අනික් සියලුම පොත් **දෙවිඳුන් ලියැව්වේ** ***යුදෙව් මිනිසුන්*** කරණකොට ගෙන ***වේ.*** දානියෙල් 4වැනි පරිච්ඡේදය නෙබුකද්නෙශර් රජ විසින් ලියා ඇති අතර, එස්රා 1වැනි පරිච්ඡේදයෙහි සහ 1 ලේකම් අන්තිමට කෝරෙෂ් රජුගේ ලිපියෙහි කොටස් අඩංගු වී තිබෙන බවද මෙහිදී සඳහන් කලයුතු වේ.

ගාබ්‍රියෙල් දූතයා නාසරෙත්හි කන්‍යාතුමියට පැවසු අනාවැකියේ '**අන්තිම කොටස**' **සම්පූර්ණ වන්නේ,** ***යාෂුවා වහන්සේ දාවිත් රජුගේ සිංහාසනය මත වැජඹෙන කල වේ***. එය කිතුණුවන් හඳුන්වන්නේ **"සහශ්‍රය"** යනුවෙනි. එම සිංහාසනයේ අසුන් ගැනිමට **අවශ්‍යය වන්නාවු** ***'සුදුසුකම්'*** **තිබේ.**

පළමුවෙන් එම තැනැත්තා ***යුදෙව්වකු* විය යුතු වේ.** එනමුත් එපමණක්ම මදිය. **ඔහු *'යුදා ගෝත්‍රයටද'* අයිති විය යුතුයි.** තවත් සුදුසුකමක් ***අත්‍යාවශ්‍ය වේ.*** එය නම් **ඔහු *"දාවිත්ගේ රජ පරම්පරාවේ"* කෙනෙකුද වියයුතු වීමයි.**

සර්වසාධාරණ දෙවියන් වහන්සේ 'අල්ප මාත්‍රයකවත්' ***නුසුදුසුකමක් නොකරන*** බව අපි දනිමු. මතෙව් පොතෙහි යාෂුවා වහන්සේගේ පරම්පරාව, 'භාරකාර පියාවූ' යෝසෙප්ගේ පැත්තෙන් පෙන්නුම් කෙරේ. එහෙයින් මතෙව් 1:6 සහ 7, දාවිත් රජුට පසු **සාලමොන් රජුගෙන්** ගලා ආ සැටි පෙන්නුම් කරයි. එතුමන්ගේ මව්වීමට දෙවිඳුන් තෝරා ගත්, 'මරියා' නමින් සාමාන්‍යයෙන් හඳුන්වන නුමුත්, සැබෑ නම "මීරියම්" වන කාන්තාවගේ පැත්තෙන්, ලූක් කතුවරයා, යාෂුවා වහන්සේ පැමිණි පරම්පරාව පෙන්නුම් කරයි. එහෙයින් ඔහු ලියු ශුභාරංචියේ 3:31 හි, "**නාතන්ගේ පුත්‍ර වූ** මත්තතාගේ පුත්‍රයාය" කියා සඳහන් වේ. නාතන්ගේ පියා ***'යෙස්සේගේ පුත්‍රවූ දාවිත්'*** යැයි 32 වැනි පදය පෙන්වා දෙයි. 2 සාමුවෙල් 5:14 හි, නාතාන් සාලමොන් රජුගේ, *වැඩිමහල් සොහොයුරෙකු* බව පෙන්නුම් කරයි. එහෙයින් යාෂුවා වහන්සේගේ මෑණියන් පැමිණියේ, සලමොන් රජු කරණකොටගෙන ***නොවූවත්*** දාවිත් රජුගේ වංශයෙන් බව, දේව වචනයේ පැහැදිව සඳහන් වේ.

බයිබලයේ අන්තිම පොතේ (එළිදරව්) අන්තිම පරිච්ඡේදය වන 22හි, යාෂුවා වහන්සේ 12 වැනි පදයෙහි සිට තමන් වහන්සේගේ නැවත පැමිණීම සඳහන් කරමින්, 16 වැනි පදයේ, **"මම වනාහී *<u>දාවිත්ගේ මුල</u>* සහ *වංශය යැයි*"** පවසනසේක. එහි එතුමන් සඳහන් කරන්නේ, <u>අතීතය පිළිබඳව</u> ***<u>නොව,</u>*** තමන් වහන්සේගේ **දෙවෙනි පැමිණීමේදී, *'දාවිත්ගේ වංශයේ කෙනෙක් ලෙස'* එතුමන් පැමිණෙන බව** ඉතා පැහැදිලිය. ***එහෙයින් දාවිත්ගේ සිංහාසනය මත හිඳ,*** **"යාකොබ්ගේ වංශය කෙරෙහි" රජ කිරීමට, *යාෂුවා වහන්සේට <u>සෑම සුදුසුකමක්ම</u> තිබෙන බව පෙන්නුම් කෙරේ.***

අපොස්තුලුවරු සියල්ලෝම ***යුදෙව් අයවූ නිසා*** **යාෂුවා වහන්සේට මේ සෑම සුදුසුකමක්ම තිබෙන බව *දැන* සිටියහ.** ක්‍රියා 1:6 සඳහන් වන, ***'රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නය'*** ඔවුන් ඇසුවේ එම නිසාය.

එනමුත් එවකට ඔවුන් ***නොදැන සිටි "සත්‍යතාවය" නම්,*** දෙවියන් වහන්සේගේ **"ඉමහත් සැලැස්ම", *එතුමන් මැව්වාවූ* 'මුලු මිනිස් සංහතිය *උදෙසාම*'** බවයි. ඒ සැලැස්ම අනුව, <u>යොහාන් 3:16 යේ සඳහන් ප්‍රකාර</u>, **"පාපයෙන් මිදීමේ පණිවිඩය",** ***<u>අන්‍ය ජාතීන් වෙතටද යා යුතුව තිබුණේය.</u>***

වර්තමානයේ ජීවත් වන අපහට, **'බයිබලයේ සඳහන් වන්නාවූ ජීවිත රටාව'** පිලිබඳව ***නිසි අවබෝධයක් නැතිවීම,*** බොහෝ දේවල් හරියාකාරව ඒත්තු ගැනිමට ***බාධකයක්ව තිබේ.*** ක්‍රියා පොතෙහි සඳහන් වකවානුවේ, **මුද්‍රණ ශිල්පය තිබුණේ නැත.** දේව වචනය බැටලු හම් මත, පන්හිඳ වැනි දෙයකින්, අතින් ලියා තිබුණි. **එහෙයින් එම පිටපත් තිබුනේ අතලොස්සකි.** ඒවාද තිබුනේ, ***යුදෙව්වන් සතුව පමණි.***

ඊශ්‍රායෙල් රටින් බැහැරව, ග්‍රීක් භාෂාව කතා කිරීමට පුරුදුව ජීවත් වූ යුදෙව්වන් සමහරක්, එම බසින් ලියවුනු **"සෙප්තුවාජින්ට්"** නමින් හඳුන්වන ලද පිටපත් භාවිතා කලහ. එනමුදු එකල විසූ ***අන්‍ය ජාතීන්,*** "මැවුම්කාර දෙවිඳුන්" ගැනවත්, එතුමන්ගේ **කැමැත්ත සහ අරමුණු, 'හේබ්‍රෙව් නැතහොත් ඊශ්‍රායෙල් හෝ යුදා'** නැමති මිනිස් කණ්ඩායමකට එළිදරව් කර තිබුණු බවවත්, ***දැන නොසිටියහ.***

යුදෙව් මිනිසුන් අතර ජීවත් වූ සමහර ***අන්‍ය ජාතික මිනිසුන් ස්වල්ප දෙනෙක්,*** මේ දෙවියන් වහන්සේ ගැන අසා තිබුණහ. එයින් සමහර දෙනෙක් ***යුදා ආගම වැළඳගෙන සිටි අතර,*** තව ස්වල්ප කොටසක් එම දෙවිඳුන් හට යාඥා කිරීමට පුරුදුව සිටියහ. ඒ අය ගැන ක්‍රියා පොතෙහි සඳහන් වන හෙයින්, ඔවුන් ගැන විස්තරයන් ඉදිරියේදී ලියැවෙනු ඇත.

ඉහත සඳහන් ප්‍රශ්නය අපොස්තුලුවරුන් අසන කල, **එක වතාවකටවත් මෙසියස් වහන්සේ කෙනෙක් එන බව,** මේ අන්‍ය ජාතීන් සුළුතරය හැරෙන්නට, ***අනෙක් කිසිකෙනෙක් දැන සිටියේ නැත***. එහෙයින් ප්‍රථමයෙන් යාෂුවා වහන්සේගේ මාංශගතවීමද, පාපයේ වන්දිය ගෙවන පිණිස කුරුසපත්වීමද, මරණය පරාජය කරමින් ***නැවත නැගිටීමද,*** වන **'ශුභාරංචිය',** ***අන්‍ය ජාතීන් අතර*** **දේශනා කළ යුතුව** තිබුණි. ***ක්‍රියා පොතෙහි සඳහන් වන්නේ*** **එය ආරම්භ වී, ඉදිරියට ගලා ආ හැටියි.**

ඒ සියල්ලක්, මෙම ප්‍රශ්නය ඇසූ යුදෙව් ගෝලයන් එකල **දැන නොසිටියහ.** ඊටත් වඩා කණගාටුවට කරුණ වන්නේ, මුළු මිනිස් ඉතිහාසය පුරාවටම මේ දක්වාද, යුදෙව් මිනිසුන් බහුතරයක් 'එම ශුභාරංචිය *නොදැන* සිටීම' සහ **ඔවුන්ගේම බයිබලයේ සඳහන් වන,** ***ඔවුන්ගේ*** **මෙසියස් වහන්සේ පැමිණ,** ***යෙසායා 53 නේ සඳහන් අනාවැකි සම්පූර්ණ කල බවද*** **ඔවුන් බොහොමයක් නොදැන සිටීමයි.**

***"අන්‍ය ජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තෙක්"*** එය එලෙස පවතින බව, ක්‍රියා පොතෙහි ප්‍රධාන චරිතයක් වන පාවුලුතුමා, **රෝමවරුන්ට ලියූ "යැවුම් පත්‍රයෙහි" 11:25 හේ සඳහන් කරයි.**